# මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය - 2020
# Primary Piriven First Term Test - 2020

(03) ත්‍රිපිටක ධර්මය *I*
ශ්‍රේණිය 03

කාලය : පැය 01
Time

**සැලකිය යුතුයි.**

➢ ***I*** **කොටස් ප්‍රශ්න සියල්ලටම ද *II* හා *III* කොටස් වලින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## I කොටස

➢ **නිවැරදි වරනය යටින් ඉරක් අඳින්න.**

1) බෝසතාණෝ අභිනිෂ්ක්‍රමණය කළේ,
(1) වයස 28 දී (2) වයස 29 දී (3) වයස 85 දී (4) වයස 16 දී

2) ප්‍රථම සම්බෝධියේ දී සංඝයා පාලනය සඳහා දෙසුවේ,
(1) ඕවාද ප්‍රාතිමෝක්ෂයයි (2) ආණාප්‍රාතිමෝක්ෂයි
(3) පඤ්ච සීල ප්‍රතිපදාවයි (4) සරණාගමනයයි

3) බුදුරජාණෝ අටලොස් වසක් වැඩසිටි ආරාමය,
(1) වේළුවනාරාමයයි (2) පූර්වාරාමයයි (3) ජේතවනාරාමයයි (4) පන්ථාරාමයයි

4) දඹදිව පැවති මහාරාජ්‍ය හතරින් එකකි,
(1) වජ්ජි රාජ්‍යය (2) ශාක්‍ය ජනපදය (3) කපිල වස්තුව (4) කෝසල රාජ්‍යය

5) මිහිඳු හිමි ලක්දිවට වැඩම කළේ,
(1) වෙසක් පෝ දිනය (2) ඇසළ පෝ දිනය (3) පොසොන් පෝ දිනය (4) දුරුතු පෝ දිනය

6) බින්දුසාර රජුගේ ඇවෑමෙන් රජවූයේ,
(1) උත්තිය කුමරු (2) නාලක කුමරු (3) ජේත කුමරු (4) අශෝක කුමරු

7) සෙඛියා ගණන කීය ද?
(1) 65 කි (2) 85 කි (3) 75 කි (4) 72 කි

8) ඡබ්බග්ගිය භික්ෂු කණ්ඩායමට අයත් දෙනමකි.
(1) අසසජි, පුණබ්බසුබ (2) අසසජි, දේවදත්ත
(3) මත්තිය, කෝකාලික (4) බුම්මජක, සොණ

9) විනය යනු කුමක් ද?
(1) සදචාරයයි (2) ඕනෑකමයි (3) වාසනාවයි (4) හික්මීමයි

10) කමාවචර සිත් ගණන
(1) සිත් 57 කි. (2) සිත් 574 කි. (3) සිත් 52 කි. (4) සිත් 58 කි.

11) කාමවස්තූන් කෙරෙහි ඇති කැමැත්ත,
(1) උද්ධච්චයයි (2) ථීනමිද්ධයයි (3) කාමච්ඡන්දයයි (4) ව්‍යාපාදයයි

12) භාවනාවට එළඹි තැනැත්තා හඳුන්වන්නේ,
(1) යෝගාවචර (2) කාමාවචර (3) කම්මට්ඨාචායෑ (4) සීලාචාර

13) අනුන් දෙන පිනෙන් ජීවත් වන්නේ,
(1) ශුද්‍ර ජීවීන්ය (2) පරසක්වල ජීවීන්ය. (3) පරදත්තූප ජීවීන්ය (4) නිසාචරයන්ය

14) පඤ්ච නීවරණ ධර්‍ම සමනයට උපකාර වන්නේ,
(1) විදර්ශනා භාවනාවයි (2) සමථ භාවනාවයි
(3) ආනාපානසති භාවනාවයි (4) මෛත්‍රී භාවනාවයි

15) පුරා සිව්මසක් බුදුරජාණෝ අභිධර්‍මය දේශනා කළේ,
(1) මාතෘ දිව්‍ය පුත්‍රයාටය (2) මාර දිව්‍ය පුත්‍රයාටය
(3) ශක්‍ර දේව පුත්‍රයාටය (4) රාධ පුත්‍රටය

16) ආනන්තරිය පාප කර්මයකි.
(1) සංඝ සාමග්ගිය (2) සංඝ පාලනය (3) සංඝ භේදය (4) සංඝොපස්ථානය

17) ශ්‍රී රාහුල හිමි වැඩ සිටි පිරිවෙන,
(1) වීරබා පිරිවෙන (2) විජය පිරිවෙන (3) විදෙසාදය පිරිවෙන (4) විජයබා පිරිවෙන

18) චූල සුභද්‍ර විවාහ වූයේ,
(1) උග්ගසිටුපුත් සමගය (2) වජ්ජිපුත් සමගය
(3) නිගණ්ඨනාථ පුත් සමගය (4) ජේත කුමරු සමගය

19) මිහිඳු හිමිගේ ආචාර්යන් වහන්සේ,
(1) මොග්ගලි පුත්ත තෙරුන්ය. (2) මහා දේව තෙරුන්ය.
(3) දේවදත්ත තෙරුන්ය. (4) මබාදේව තෙරුන්ය.

20) දෙවන පෑතිස් රජුගේ බෑනා වූයේ,
(1) උත්තිය අමාත්‍යය. (2) නාලක අමාත්‍යය. (3) අරිට්ඨ අමාත්‍යය. (4) කැබිනට් අමාත්‍යය.

(2 × 20 = 40)

## II කොටස

**පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1) අ) සතර පරමාර්ථ ධර්‍ම නම්කරන්න.
ආ) ලෝභ මූලික සිත් ගණන කොපමණ ද? ඉන් හතරක් ලියා දක්වන්න.
(4 + 8 = 12)

2) අ) පහත සඳහන් ගාථා සම්පූර්ණ කර ලියන්න.
i. කුම්භූපමං..
ii. අචිරං වතයං....
ආ) ඉන් එක් ගාථාවක නිධාන කථාව ඔබේ බසින් ලියන්න.
(6 + 6 = 12)

3) අ) ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ හතරක් (4) ක් නම් කරන්න.
ආ) මිහිඳු මා හිමි අනුරාධපුරයට වැඩමවීමෙන් පසු සිදු වූ වැදගත් සිදුවීම් හතරක් (4) ක් ලියා දක්වන්න.
(4 + 8 = 12)

4) අ) සෙබියා පැනවීමට හේතු පැහැදිලි කරන්න.
ආ) ඔබ පෙළ පොතේ සඳහන් පරිදි උජ්ජග්ගිකවග්ගයේ 1, 2, 3, 4 යන ශික්‍ෂාපද ලියා එහි අර්ථය ද ලියන්න.
(5 + 7 = 12)

## III කොටස

5) අ) සූත්‍ර පිටකයට අයත් ගාථ පහ ලියා දක්වන්න.

ආ) ධම්මපදයේ චිතත වගගය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(5 + 7 = 12)

6) අ) ස්ඛන්ධ පඤ්චකය නම් කරන්න.

ආ) සංයුත නිකායේ කුම්භ සූත්‍රයෙහි එන බුදුරදුන් වදාළ උපමා කථාව ලියා දක්වන්න.

(5 + 7 = 12)

7) අ) දඹදිව පැවති මහා රාජ්‍ය හතර නම් කරන්න.

ආ) කොසොල් රජතුමා විසින් දෙන ලද අසදෘස මහා දානය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(4 + 8 = 12)

8) අ) කැළණිතිස්ස රජු දවස මුහුද ගොඩ ගැලීමට හේතු වූ කථා පුවත කෙටියෙන් ලියන්න.

ආ) යථාවාරි වහාපුරා යන තිරො කුඩඩසූත්‍ර පාඨය සම්පූර්ණ කර එහි අර්ථය ලියා ඉන් අර්ථවත් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(5 + 7 = 12)